# දැන්වීම

## ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශය

## ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනයේ ප්‍රධාන කාර්යාලයේ භෝජනාගාරය පවත්වා ගෙන යාම සඳහා මිල ගණන් කැඳවීම.

ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනයේ ප්‍රධාන කාර්යාලයේ පිහිටි භෝජනාගාරය පහත සඳහන් කොන්දේසි හා නියමයන් යටතේ පවත්වාගෙන යාම සඳහා ලංසු කැඳවනු ලැබේ.

**01.** ප්‍රසම්පාදන අයදුම්පත් ගාස්තු වශයෙන් එක් එක් අයදුම්පත් සඳහා ආපසු නොගෙවනු ලබන රු:1000.00 මුදලක් 2025.09.29 සිට 2025.10.17 දින පෙ.ව. 9.00 සිට ප.ව 3.00 දක්වා කාලය තුළදී, අධ්‍යක්ෂ ජනරාල් /නාරා නමින් කාක දූපත මට්ටක්කුලිය.කොළඹ-15, පිහිටි ප්‍රධාන කාර්යාලයේ මුදල් අංශය වෙත ගෙවා ලබා ගත් රිසිට්පත සමග ලංසු ලේඛන ලබා ගැනීම සඳහා ඉල්ලීම් ලිපියක් මිලදී ගැනුම් හා සැපයුම් ඒකකය වෙත ඉදිරිපත් කිරීමෙන් ප්‍රසම්පාදන අයදුම්පත් ලබා ගත හැකිය.

**02.** ආපනශාලා පවත්වාගෙන යාමට අවශ්‍ය විදුලිය, ජලය, ගෑස් ආපනශාලාවට අවශ්‍ය ගෘහ භාණ්ඩ, අල්මාරි, මුළුතැන්ගෙයි උපකරණ සහ පිගන් භාණ්ඩ ආයතනය විසින් සපයනු ලැබේ.

**03.** ආපන ශාලාව සඳහා මාසිකව රු.2500.00ක කුළියක් අයකරනු ලැබේ.

**04.** පිළිගත් වාණිජ බැංකුවකින් ලබාගත් ලංසු බැදුම්කරයක් හෝ අධ්‍යක්ෂක ජනරාල්/නාරා නමින් ප්‍රධාන කාර්යාලයේ මුදල් අංශය වෙත ගෙවා ලබා ගත් රිසිට්පත ප්‍රසම්පාදන ලේඛණ සමග ඉදිරිපත් කළ යුතු වේ.
I) භෝජනාගාරය පවත්වාගෙන යාමේදී ගිවිසුම සඳහා තැබිය යුතු ඇප මුදල රු:100,000.00 කි. සේවාවන් නිසි පරිදි ඉටු කරන බවට මෙම ගිවිසුම අත්සන් කරන දිනයේදීම ඉහත මුදල ඇප තැබිය යුතුය.
II) ලංසු ඉදිරිපත් කිරීමේදී රු:5,000.00 ක ලංසු ඇපකරයක් තැබිය යුතුය. යම් හෙයකින් ලංසුව පිළිගැනීමෙන් පසු භෝජනාගාරය පවත්වාගෙන යාම ප්‍රතික්ෂේප කළේ නම් , ඉහත මුදල නාරා ආයතනය සතු වේ.

**05.** ලංසු ඉදිරිපත් කරන ආයතන විසින් සපයන අයදුම්පත,එනම් මුල් පිටපත හා අනු පිටපත වෙන් වෙන්ව කවරවල බහා මුද්‍රා තබා එම යුගලය එක් කවරයක බහා කවරයේ වම්පස ඉහළ කෙළවර **" නාරා ප්‍රධාන කාර්යාලයේ භෝජනාගාරය පවත්වා ගෙන යාම සඳහා මිල ගණන් කැඳවීම - 2026/2027 ටෙන්ඩර් පෙට්ටි අංක - 04 "** යනුවෙන් සඳහන් කළ යුතුය.

**06. ලංසු ලබා ගත් ලංසුකරුවන් සඳහා පෙර දැනුවත් කිරීමේ රැස්වීම 2025.10.08 පෙ.ව 11.30 ප්‍රධාන ශ්‍රවණාගාරයේදී පැවැත්වේ.**

**07.** **" නාරා ප්‍රධාන කාර්යාලයේ භෝජනාගාරය පවත්වා ගෙන යාම සඳහා මිල ගණන් කැඳවීම-2026/2027 ටෙන්ඩර් පෙට්ටි අංක -04"**ලෙස නිසි පරිදි සම්පූර්ණ කරන ලද ඔබගේ ලංසු නාරා ප්‍රධාන කාර්යාලයේ පළමු මහලේ පිහිටි මුදල් අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටි වෙත දැමිය යුතු වේ.

**08. 2025.10.21 ප.ව 1.00**ට ලංසු විවෘත කරනු ලබන අතර, එම අවස්ථාවට ලංසුකරුට හෝ ඔහුගේ නියෝජිතයෙකුට සහභාගි විය හැකිය.

**09.** ප්‍රසම්පාදන කමිටු තීරණය අවසන් තීරණය වේ.

සභාපති
ප්‍රසම්පාදක මණ්ඩලය
ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය
කාක දූපත ,මට්ටක්කුලිය
කොළඹ-15
011-2529717/011-2524430